# සප්ත පදාර්ථවල ආයුර්වේදීය උපයෝගිතාව

**ඩී. ඒ. ඩී. තමරිතා නිරෝෂනි, එස්. පී. මොල්ලිගොඩ**

ආයුර්වේදයේ මූලික පරමාර්ථය / ප්‍රයෝජනය වන්නේ නිරෝගී තැනැත්තාගේ නිරෝගී බව රැක ගැනීමත්, රෝගී තැනැත්තාගේ රෝග සුවපත් කිරීමත්ය.

ප්‍රයෝජනං චාස්‍ය ස්වස්ථස්‍ය ස්වාස්ථ්‍ය
රක්‍ෂණාම් ආතුරස්‍ය විකාර ප්‍රශමනං ච

මේ සඳහා ඉවහල් වන්නේ ආයුර්වේදයේ "ත්‍රිසූත්‍ර" යයි.

එනම්,

1. හේතු සූත්‍ර
2. ලිංග සූත්‍ර
3. ඖෂධ සූත්‍ර යන සූත්‍රයි

මෙහි හේතු සූත්‍ර යනු රෝගයන්ගේ හේතු වන අතර ලිංග සූත්‍ර යනු රෝගියාගේ රෝග ලක්‍ෂණයි. රෝග සඳහා යොදන බෙහෙත්, ඖෂධ සූත්‍ර ලෙස සැලකේ.

ආයුර්වේදයේ ඉගැන්වෙන මෙම මූලික කරුණු, එනම් රෝගියාගේ රෝගී බව පහකිරීම සහ නිරෝගී තැනැත්තාගේ නිරෝගී බව රැක ගැනීම සඳහා ත්‍රිසූත්‍රය යොදා ගැනීමේ දී සප්ත පදාර්ථ භාවිතා වේ. එනම් ආයුර්වේද චිකිත්සාව සඳහා සප්ත පදාර්ථ ඉතා වැදගත් වේ. ඒවානම් ද්‍රව්‍ය, ගුණ, කර්ම, සාමාන්‍ය, විශේෂ, සමවාය හා අභව පදාර්ථ වේ.

මෙහිදී අප මුලින්ම ද්‍රව්‍ය පදාර්ථය ආයුර්වේදයේදී උපයෝගී වන අන්දම සලකා බලමු.

ආයුර්වේද දර්ශනයට අනුව මෙලොව පවතින සෑම දෙයක්ම පංච මහා භූතයන්ගෙන් නිර්මාණය වී ඇත. එනම් මූලිකවම සියලුම ජීවීන් ද පංච මහා භූතයන් ගෙන් ඇතිවිය. එනම් ද්‍රව්‍ය පදාර්ථය යටතේ විස්තර වුණු නව ද්‍රව්‍යයන් ගෙන් ද්‍රව්‍ය 5ක් අයත් වන මෙම පංච මහා භූතවල යම් වෙනසක් ඇති වුවවොත් එය ජීවියාගේ / මිනිසාගේ ප්‍රකෘති තත්ත්වය වෙනස් කිරීමට හේතු වේ. එනම් මිනිසා රෝගී තත්ත්වයට පත්වේ.

---

© ඩී. ඒ. ඩී. තමරිතා නිරෝෂනී, එස්. පී. මොල්ලිගොඩ
විමර්ශා ශාස්ත්‍රීය සංග්‍රහය, මංගල කලාපය, 2009
මෞලික සිද්ධාන්ත අධ්‍යයනාංශය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

එනම් මෙහිදී පංච මහා භූත ආයුර්වේදයේ ත්‍රිසූත්‍රයේ දී උපයෝගී වන අන්දම සාකච්ඡා කළ හැක.

එසේම ආයුර්වේදයේ සඳහන් අන්දමට රෝග හේතු, අභ්‍යන්තර හේතු හා බාහිර හේතු වශයෙන් ආකාර 2කි.

මෙහිදී බාහිර හේතු නැවතත්,

1. වාත කෝපන හේතු
2. පිත් කෝපන හේතු
3. සෙම් කෝපන හේතු වශයෙන් කොටස් කළ හැක.

අභ්‍යන්තර හේතු යනු දෝෂ, ධාතු, මල යන මේවා දූෂණය වීමයි. මේවා ප්‍රකෘති තත්ත්වයෙන් පවතින විට ශරීරය නිසියාකාරව පවත්වා ගැනීමට උපකාරී වන අතර විකෘති වූ විට රෝග ඇති කරයි.

මෙලොව පවතින සෑම දෙයක්ම පංච මහා භූතවලින් නිර්මාණය වී ඇති නම්, ජීවියා, ජීවියාගේ නිරෝගී බව හෝ රෝගී බව පවත්වා ගෙන යන හේතු සහ එම රෝගී තත්ත්වය සුවකිරීමට ලබාදෙන ඖෂධ සහ ආහාරපාන යනාදිය ද පංච භෞතික විය යුතුය.

උදාහරණයක් ලෙස කළු දෝෂය වෘද්ධි වීමක් නිසා ඇති වූ රෝග තත්ත්වයක් සලකා බලමු.

කළු දෝෂය පෘථිවි සහ ආප් භූතයන් ගෙන් නිර්මාණය වී ඇත. පෘථිවි සහ ආප් භූත අධික එනම් මධුර රසැති ආහාර පාන අධිකව ගැනීම කළු කෝපවීමට හේතු වේ. මෙම රෝග නිවාරණය සඳහා කටු, තිත්ත, කසට රසැති ඖෂධ හා ආහාරපාන ලබාදීමෙන් තේජ, වායු හා ආකාශ භූතයන් අධික කෙරේ.

මේ අනුව රෝගයකට හේතු සහ රෝග නිවාරණය සඳහා පංච මහා භූතවල බලපෑම ඉහත අයුරින් අනෙකුත් දෝෂ 2ට ද විස්තර කළ හැක.

කෙසේ වෙතත් මෙහිදී කිව යුතු වැදගත් කරුණක් නම් පංචමහා භූතවලින් නිර්මාණය වූ ත්‍රිදෝෂයන් ප්‍රකෘති තත්ත්වයෙන් පවතින විට සාමාන්‍ය ශරීර ක්‍රියා පවත්වා ගෙන යන්නේ, චන්ද්‍රයා, සූර්යයා සහ සුළඟ මගින් මේ විශ්වයේ සිදුවන දීම, ඇදගැනීම හා විසුරුවාහැරීම යන ක්‍රියා සිදුවන අයුරින් වන අතර එම ත්‍රිදෝෂ විකෘති තත්ත්වයකට පත්වීම බොහොමයක් රෝග වලට මූලික හේතුව වේ.

"විසර්ගාදාන වික්ෂේපෛඃ
සෝම සූර්යානිලාස්යථා
ධාරයන්ති ජගද්දේහං
කඵ පිත්තානිලාස්තථා"

උදාහරණ ලෙස ධාතු පිළිබඳව සලකන විට ශුක්‍ර ධාතුව ක්ෂීණ පුද්ගලයන්ට පෘථිවි හා ආප් භූත බහුල මධුර රසැති ආහාර පාන, ඖෂධ දීම මගින් ශුක්‍ර ප්‍රමාණය වර්ධනය කෙරේ.

මල පිළිබඳව සලකා බැලීමේ දී මුත්‍ර ප්‍රමාණය ක්ෂීණවීමට ආප් භූතය බහුල ආහාරපාන අඩුවෙන් ගැනීම හේතු විය හැකි අතර එම භූතය අධික ආහාරපාන සේවනයෙන් මුත්‍ර ප්‍රමාණය වැඩිකර ගත හැක.

මේ අයුරින් ශරීරයේ රෝගී බව පහකිරීම සහ නිරෝගී බව පවත්වා ගෙන යාම සඳහා පංච මහා භූතවල වැදගත්කම විස්තර කළ හැකි අතර මීළඟට නව ද්‍රව්‍යයන්ගේ ඉතිරි ද්‍රව්‍ය සතර වන කාල, දික්, ආත්ම, මනස් යන ද්‍රව්‍යයන් ආයුර්වේදයේ භාවිත වන අන්දම සලකා බලමු.

ජීවිතයේ එක් එක් කාල වලදී සහ දවසේ විවිධ කාල වලදී ඇතිවන රෝග විවිධත්වය සහ ඒවායේ ප්‍රවණතාවය පිළිබඳවත් චිකිත්සාවේදී කාලයෙහි වැදගත්කමත් ආයුර්වේදයේ දක්වා ඇත.

ඒ අනුව ළමා කාලයේ දී සහ දවසේ උදේ වරුවේත් ආහාර ගත් විගසත් කඵ දෝෂය බහුල වන බවත් තරුණ වියේදී සහ දවසේ දිවා කාලයේදී පිත් දෝෂය අධික වන බවත් මහලු වියේ දී සහ දවසේ සවස් කාලයේ දී වාත දෝෂය අධික වන බවත් ආයුර්වේදයේ විස්තර වෙයි. ඒ අනුව ඒ ඒ කාල වලදී ඇතිවන රෝගවල විවිධත්වයක් පවතී.

උදා: කුඩා ළමුන්ට සෙම් රෝග (උදා: හතිය/ඇදුම) බහුල වන අතර තරුණ වියට එළඹීමත් සමඟ එම රෝග තත්ත්වයන් බොහෝ දෙනෙකුට ඉබේම පහවී යයි.

එසේම සමහර රෝගයන්වලදී ප්‍රතිකාර කිරීමට ද සුදුසු කාල ආයුර්වේදයේ දක්වා ඇත.

උදා: අක්ෂි රෝග වලදී ප්‍රතිකාර කිරීමේ දී ඉර බැස යාමට ප්‍රථම ඇස්වලට ඖෂධ දැමිය යුතු බව දක්වා ඇත්තේ සවස් කාලය වන විට වාත දෝෂය අධික වන බැවිනි.

එසේම තවත් සමහර රෝගවලදී ආහාරයට පෙර හෝ පසු වශයෙන් ඖෂධ ලබාගන්නා ලෙස නියම කිරීමේදී කාලය උපයෝගී කරගෙන ඇති බව පෙනේ.

මීළඟට දිශාව නම් පදාර්ථය උපයෝගී කරගැනීම ද ආයුර්වේදය මඟින් සිදුකර ඇත. සමහර රෝග අවස්ථාවලදී ඖෂධ සඳහා ලබා ගන්නා ශාකමුල් ලබාගත යුත්තේ වෛද්‍යවරයා විසින් නියම කරන ලද නිශ්චිත දිශාවකට ගිය මුල්ය.

තවද සුශ්‍රැත සංහිතා 29 වන අධ්‍යායයේ ද සඳහන් වන පරිදි ප්‍රශස්ත - අප්‍රශස්ත දූත ලක්‍ෂණවලදී දිශාව පිළිබඳව දක්වා ඇත.

උදා: දකුණු දෙසට දොහොත් යොමු කොට විෂම ස්ථානයෙක එක් පයක් තබා උඩ බලාගෙන සිටින අය, වෛද්‍යවරයා දක්‍ෂණාභිමුඛව සිටින විට පැමිණෙන අය, ගර්හිත දූතයන් වන බවත් වෛද්‍යවරයා සුස්ථ ශරීරයෙන් යුක්තව පෙරදිගට යොමු වී සමතල වූත් පවිත්‍රවූත් පෙදෙසක පවිත්‍රභාවයෙන් සිටිනා අවධියෙක පැමිණෙන දූතයා කාර්ය සිද්ධකරන බවත් පැවසේ.

තවද ආයුර්වේද චිකිත්සාවේදී මනස බොහෝ දුරට උපයෝගී කරගන්නා අතර මානසික නිරෝගීතාවය පිළිබඳව විශේෂ අවධානයක් ද යොමු කර ඇත. මෙහිදී මානසික තත්ත්ව සඳහා බලපාන්නේ සත්ත්ව, රජස්, තමස් යන කරුණු තුන බව පැහැදිලිව දක්වා ඇත.

තවද පංච කර්මේන්ද්‍රිය හා පංච ඥානේන්ද්‍රිය අතර සම්බන්ධය පවත්වන්නේ මනසයි. ඥානය ලබාගැනීමට ඉවහල් වන නිසා මනස 6 වන ඥානේන්ද්‍රිය ලෙස ද දක්වා ඇත.

ආයුර්වේදයේ දී "ආත්මා" ට රෝග ප්‍රතිකාරයේ දී විශේෂ ස්ථානයක් ලැබී නැත. ආත්මා නිර්විකාර බැවිනි. නමුත් මනස පිළිබඳව ඉතා වැදගත් ලෙස දක්වා ඇත. කෙසේ වෙතත් ආත්මය හොඳ හෝ නරක ඵල භුක්ති විඳින අතර වෛශේෂික දර්ශනයේ වූ ආත්මාගේ ප්‍රධාන ගුණ 6 ආයුර්වේදයේ දී පිළිගනී.

මීළඟට අපි ආයුර්වේදයේ දී ගුණ පදාර්ථය උපයෝගී කරගන්නා අන්දම සලකා බලමු.

චරකයේ හා සුශ්‍රැතයේ දක්වා ඇති ගුණ ආහාර, ඖෂධ සඳහා යොදාගත හැකි පරිදි ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් ත්‍රිසූත්‍රයේදීම ගුණ පදාර්ථය උපයෝගී වන බවද කිව යුතුය.

උදා: මධුර රසැති ආහාර පාන අධිකව ගැනීම නිසා කළු කෝප වන අතර එවිට ගුරු ගුණය ආදිය වැඩිවේ.

"ශ්ලේෂ්මණඃ ස්නේහ කාඨින්‍ය - කණ්ඩු ශීතත්ව ගෞරවම්
බන්ධොපලේප ස්තෛමිත්‍ය - ශෝථාපක්ත්‍යති නිද්‍රතා
වර්ණ ඃ ශ්වේතෝ රසඃ - ස්වාදු ලවණො චිරකාරිකා"

එනම් මෙහිදී කඵ දෝෂයේ භෞතික ගුණ වෙනස් වීමක් හෝ වෘද්ධි වීමක් සිදුවේ. මේ අයුරින් කියැවෙන කඵ දෝෂයේ භෞතික ගුණ පහත සඳහන් පරිදි දැක්විය හැක.

"ස්නිග්ධඃ ශීතො ගුරුඃර්මන්දඃ
ශ්ලක්ෂණා මෘත්ස්න ස්ථිරඃ කඵඃ

(අ. හෘ. සු. 1-12)

තවද සුශ්‍රැත වැඩි දුරටත් දක්වා ඇති පරිදි ගුණයෙහි ගුණයක් නැති බව පවසා ඇත. යම් ද්‍රව්‍යයක ගුණය පවතිනුයේ ද්‍රව්‍ය ආශ්‍රිතව බව චරක පැහැදිලිව දක්වා ඇත. වෛශේෂිකයේ සෑම ගුණයක්ම චරකයේ අන්තර්ගතව ඇතත් සුශ්‍රැත පරාදී ගුණ පිළිනොගෙන ගුරු ලඝු ආදී වශයෙන් ගුණ විශේෂයක් දක්වනුයේ ආහාර හා ඖෂධවලට යෝග්‍ය වන පරිදිය.

මේ අනුව ඉහත උදාහරණයේ වෘද්ධි වූ කඵ දෝෂය සමනය කිරීම සඳහා ගුණ පදාර්ථය යොදා ගන්නා අන්දම පහත ශ්ලෝකයෙන් පැහැදිලි කර ගත හැක.

ශ්ලේෂ්මණො විධිනා යුක්තං තීක්ෂණං වමන රේචනම්
අන්නං රූක්ෂාල්පතීක්ෂණෝෂ්ණංකටුතිත්තකෂායකම්
දීඝ කාල ස්ථිතං මද්‍යං රති ප්‍රීතිඃ ප්‍රජාගරඃ
අනේක රූපෝ ව්‍යායාමශ්චින්තා රූක්ෂං විමර්දනම්
විශේෂාද් වමනං යූෂං ක්ෂෞද්‍රං මේදෝඝ්නමෞෂධම්
ධූමෝපවාස ගණ්ඩූෂ නි ඃ සුඛත්වං සුඛායච

(අෂ්/හෘ/සු/13-11-13)

එහි දැක්වෙන පරිදි කඵ දෝෂය සමනයට රූක්ෂ, තීක්ෂණ, උෂ්ණ යන ගුණයන් ගෙන් හා කටු, තිත්ත, කෂාය රසය යන ගුණයෙන් යුත් ආහාරපාන ඖෂධ ලබා ගැනීම කළ යුතුය.

මේ අනුව ත්‍රිසූත්‍රයේ කියවෙන හේතු සූත්‍රය හා ඖෂධ සූත්‍රය සඳහා ගුණ පදාර්ථය උපයෝගී වන අන්දම පැහැදිලි වන්නට ඇත.

මෙලෙසම රෝග නිවාරණයේ දී රෝග ලක්ෂණ හඳුනා ගත යුතු බැවින් ඒ සඳහා සාර්ථාදී ගුණවල කියවෙන ශබ්ද, ස්පර්ශ, රූප, රස, ගන්ධ ආදී ගුණ උපයෝගී කර ගත හැක.

උදා: කඵ කෝප වූ රෝගියාගේ දේහයේ සුදුමැලි වර්ණය රෝග නිර්ණයේ දී ලක්‍ෂණයක් ලෙස භාවිත කළ හැක.

වෙනත් රෝග අවස්ථා වලදී වුවද ආයුර්වේදයේ දී විශේෂයෙන් භාවිත වන "නාඩි බැලීම" හිදී ස්පර්ශ ගුණය යොදාගන්නා අතර හදවතේ ශබ්ද වලට සවන්දීමෙන් ද රෝගයන් නිර්ණය කළ හැක.

තවද සමහර රෝගීන්ගේ ඇති විශේෂ ගන්ධයක් මඟින් ද රෝග නිර්ණය කල හැකි අතර රසය ද රෝග විනිශ්චය සඳහා භාවිතා වේ.

උදා: කඵ දෝෂය කෝප වූ රෝගියාගේ දිවට නිතර දැනෙන්නේ පැණි රස සහ ලුණු රසයි.

තවද රෝග ලක්‍ෂණයන්ගේ ප්‍රධාන, අප්‍රධාන භාවයක් රෝග ලක්‍ෂණ ඇසුරින් නියමිත රෝගය හඳුනා ගෙන වෙන්කර ගැනීමත් රෝගයේ ප්‍රමාණය නිර්ණය කිරීමත් සඳහා පරාදී ගුණ ද භාවිත වේ.

ආයුර්වේදය කායික සුවය පමණක් නොව මානසික සුවය පිළිබඳව ද ඉතා ඉහළින් සඳහන් කරන බැවින් නිරෝගී ජීවිතයක් ගත කිරීමේ දී බුද්ධි ආදී ගුණ ද වැදගත් වේ. එනම් තරහ, වෛරය, දුක යන දේවල් පාලනය කර ගනිමින් බුද්ධිමත්ව හා සැපයෙන් ජීවත් විය යුතු බව කියැ වේ.

ආයුර්වේදයේ දී කර්‍ම පදාර්ථය භාවිත වන අන්දම මීළඟ අපි සලකා බලමු.

කර්‍ම යන්නෙන් වෛශේෂික දක්වනුයේ ඌර්ධ්වාදී පංච කර්ම විධි වුවත් ඒවා පදනම් කොට ගෙන චරක හා සුශ්‍රැත පංච කර්ම, අග්නි කර්ම, ජාත කර්ම, පූර්ව කර්ම, ප්‍රධාන කර්ම සහ පශ්චාත් කර්ම ගැන වැඩි අවධානයක් යොමු කර ඇත. මෙනයින් බලන කල වෛශේෂික දැක්වූ කර්ම පදාර්ථය චිකිත්සීයමය ස්වරූපයෙන් ආයුර්වේදය එය ප්‍රයෝගීකරණය කරයි.

තවද විවිධ කර්‍ම මගින් දෝෂ, ධාතු, මලවල වෙනස්වීම් සිදුවන අතර ඒ මගින් රෝග ඇති වේ.

උදා: "ගුරු මධුර රසාතිස්නිග්ධ දුග්ධෙක්‍ෂු භක්‍ෂයාත්
දුව දධි දිනනිද්‍රා පූප සර්පිඃප්‍රපූරෙඃ
තුහින පතන කාලෙ ශ්ලේෂ්මණො සංප්‍රකෝපං
ප්‍රභවති දිවසාදෞ භුක්ත මාත්‍රෙ වසන්තෙ

මෙහි සඳහන් වන පරිදි දහවල නිදාගැනීම (දින නිද්‍රා) කඵ කෝප වීමට හේතු වේ.

එසේම අධික ලෙස වෙහෙසී වැඩ කිරීම හා නිදි වැරීම කළු දෝෂය සමනය කිරීමට හේතුවනවා මෙන්ම වාත වෘද්ධි කිරීමට ද හේතුවේ. ඉහත සඳහන් කර්ම කිරීම හා විශේෂයෙන් වමන කර්ම කිරීම කළු දෝෂ සමනයට වැදගත් වන බව ඉහතකදී අප විසින් සඳහන් කළ "ශ්ලේෂ්මණො විධිනා යුක්තං" ආදී වූ ශ්ලෝකයෙන් කියවේ.

තවද ආයුර්වේද චිකිත්සාවේදී විශේෂ ස්ථානයක් හිමිවන "පංචකර්ම" වලදී උත්ක්ෂේපණ හා අපක්ෂේපණ යන කර්ම ප්‍රභේද දෙක වැදගත් වේ. මෙහිදී උත්ක්ෂේපණ කර්ම යටතේ වමන කර්මත් අපක්ෂේපණ කර්ම යටතේ විරේචන කර්මත් වැදගත් වේ.

ආයුර්වේදය වෛද්‍ය විද්‍යාවක් ලෙස සැලකීමේ දී ආකුඤ්චන, ප්‍රසාරණ හා ගමන යන කර්මවල යෙදීම් ද සඳහන් කළ හැක.

පේශියක් හෝ හෘදය ආකුංචනය වීම ආකුඤ්චන කර්ම යටතේදීද පේශියක් හෝ හෘදය විස්තාරණය වීම ප්‍රසාරණ කර්ම යටතේදීද දැකිය හැක. තවද ආයුර්වේද චිකිත්සාවේ වැදගත් තැනක් හිමි වන "නාඩි" වැටීම සිදුවන්නේ ස්පන්දන ආකාරයෙන් වන ගමන කර්ම යටතේය.

දැන් අපි ආයුර්වේදයේ දී සාමාන්‍ය පදාර්ථයේ යෙදීම් පිළිබඳව සලකා බලමු.

වෛශේෂික දර්ශනයේ සාමාන්‍ය පදාර්ථයේ ප්‍රභේද ලෙස දක්වා ඇත්තේ පර, අපර වුවත් ආයුර්වේදයේ සාමාන්‍ය, විශේෂ යන දෙකම එකටම විස්තර කර ඇත. එය චරකයේ විශේෂත්වයකි. ඒවායේ ප්‍රභේදකරණයේ දී චරක අනුගමනය කර ඇත්තේ ද චිකිත්සාමය ස්වරූපයකි. එනම් ද්‍රව්‍ය, ගුණ, කර්ම සාමාන්‍ය වශයෙනි. ආයුර්වේදයේ ප්‍රධාන පරමාර්ථය ධාතු සාම්‍ය හෙවත් සමතාව පවත්වා ගැනීමයි.

"සමදෝෂ සමාග්නිශ්ච සමධාතු මලඃ ක්‍රියා
ප්‍රසන්න ආත්මේන්ද්‍රිය මනඃ ස්වස්ථ්‍ය ඉත්‍යභිධීයතේ"

(සු/සූ/25 - 41)

එනම් මෙහිදී සාමාන්‍ය පදාර්ථය මගින්, අඩු වූ දෝෂ, ධාතු, මල වැඩි කිරීම සිදු කරයි.

උදාහරණයක් ලෙස හදිසි අනතුරකදී බාහිර හෝ අභ්‍යන්තර රුධිර වහනයක් මගින් ශරීරයේ රුධිරය ප්‍රමාණය අඩුවුවහොත් වහාම එම තැනැත්තාට රුධිරය ලබාදීම සිදුකරයි.

තවද මාංස ධාතුව ක්ෂීණ පුද්ගලයන්ට මාංස ආහාරයට ලබාදීම මගින් මාංස ධාතුව අධික කෙරේ. එනම් මෙම අවස්ථාවලදී ද්‍රව්‍යමය වශයෙන් වෘද්ධි කිරීමක් සිදුවන බැවින් ද්‍රව්‍ය සාමාන්‍ය ක්‍රියාත්මක වේ.

තවත් අවස්ථාවකදී ශුක්‍ර ධාතුව ක්‍ෂීණ පුද්ගලයකුගේ ශුක්‍ර ධාතුව වර්ධනය කිරීම සඳහා කිරි පානයට ලබාදීම සිදු කරයි. මෙහිදී ශුක්‍රය හා කිරි ද්‍රව්‍ය වශයෙන් වෙනස් වුවත් කිරිවල ඇති මධුර රසය ශුක්‍ර වර්ධනයට සමත්ය. මීට හේතු වන්නේ ශුක්‍රය ද මධුර රසයෙන් යුක්ත වීමයි. එනම් මෙහිදී සමාන ගුණ යෙදීමෙන් ද්‍රව්‍යයන්ගේ ඒකීය භාවයක් ඇති කරන්නේ ගුණ සාමාන්‍යය යි.

දෝෂ, ධාතු, මල වල යම් යම් වෙනස්කම් සඳහා විවිධ ක්‍රියාවන්වල නිරත වීම මඟින් ඇතිවන බලපෑම විස්තර කිරීමේ දී කර්ම සාමාන්‍ය වැදගත් වේ.

උදා: කඵ දෝෂ වෘද්ධි වීම සඳහා එක තැන ඉඳගෙන සිටීම සහ නිදා ගැනීම.
වාත දෝෂය වෘද්ධි කිරීම සඳහා අධික ව්‍යායාම, ඇවිදීම, පිහිනීම වැනි ක්‍රියාවල නිරත වීම.

උපවාසය මෙන්ම අධික මෛථුන්දම් සේවනය ද පිත කෝපවීමට හේතු වේ.

මීළඟට විශේෂ පදාර්ථය ආයුර්වේදයේ උපයෝගීතාවය පිළිබඳව අවධානය යොමු කරන අතර මෙහිදී විශේෂ පදාර්ථය මඟින් වැඩි වූ දෝෂ අඩු කිරීමක් සිදු කරයි. චරකාචාර්යවරයා විසින් මෙම විශේෂ පදාර්ථය ද ද්‍රව්‍ය, ගුණ හා කර්ම විශේෂ ලෙස වර්ග කර ඇති අතර ඒවා ආයුර්වේද චිකිත්සාවේදී ඉතා වැගත් වේ.

ද්‍රව්‍ය විශේෂ යටතේ දී වැඩි වූ යම්කිසි ද්‍රව්‍යයක් අඩු කිරීම සඳහා තවත් ද්‍රව්‍යයක් යොදා ගැනීම සිදුවේ.

උදා: කඵ දෝෂය වෘද්ධි වූ විට අධික වශයෙන් පැරණි මද්‍ය වර්ග පානය කිරීමත් විශේෂයෙන් මේදස් නැසීම සඳහා මීපැණි මෙන්ම සුදුළූණු ආදිය යොදා ගැනීමත් සිදුවේ.
පිත් දෝෂය වෘද්ධි වූ විට ඝෘත හෙවත් ගිතෙල් යොදා ගැනීම කරයි.
වාතය වෘද්ධි වූ විට තල තෙල් භාවිත කරයි.

යම් කිසි ද්‍රව්‍යයක් භාවිත කර එහි ගුණ ආධාරයෙන් ඊට විපරීත ගුණවල අඩු කිරීමක් සිදු කිරීම ගුණ විශේෂය යටතේදී සිදුවේ.

උදා: කඵ දෝෂය වෘද්ධි වූ විට රූක්‍ෂ ගුණ සහිත ආහාර හා ඖෂධ ලබාදීමෙන් කඵ දෝෂයේ වෘද්ධි වූ ගුණ අඩු කළ හැක.
ස්නිග්ධ හා උෂ්ණ ගුණවලින් යුතු ආහාර හා ඖෂධ ලබාදීම මඟින් වෘද්ධි වූ වාත දෝෂය සමනය කළ හැක.

කර්ම විශේෂ යටතේ දී යම්කිසි කර්මයක් මගින් යම් යම් දෝෂ ක්‍ෂය කිරීම සිදු කරයි.

උදා: ලංඝනය හා ව්‍යායාම ආදී ක්‍රම වලින් කළු දෝෂය අඩු කිරීම.
ශරීරයට විවේකය ලබාදීමෙන් වායුවේ ක්‍රියා අඩු කිරීම.

මීළඟට සමවාය පදාර්ථය ආයුර්වේදයේ උපයෝගිතාවය පිළිබඳව සැලකීමේ දී සමවාය පදාර්ථය ආයුර්වේදයේ දී මනා ලෙස උපයෝගී කරගන්නා බව කිව යුතුය.

එනම් යම් ද්‍රව්‍යයක් හා වෙන්කළ නොහැකි සේ බැඳී පවතින ගුණ හා කර්ම උපයෝගී කොට, ගුණ හා කර්ම දෙස බලා දෝෂයක් වැඩි කිරීමෙන් හෝ අඩුකිරීමෙන් ඒවා සමතාවයකට ගෙන ඒම සඳහා සමවාය පදාර්ථය උපකාරී වේ.

මේ අනුව යම් ද්‍රව්‍යයක ගුණයක් හා කර්මයක් සමවායව බැඳී තිබීම නිසා ම අපට ද්‍රව්‍ය ප්‍රයෝගයෙන් අපේක්ෂා කරන ගුණ කර්මය ලබාගත හැකි වන්නේ ද මෙම සමවායෙනි. මෙය ආයුර්වේද චිකිත්සාවේදී ඉතා වැදගත් වන පදාර්ථයකි.

උදා: කිරි පානය මගින් ශුක්‍ර ධාතුව හා කළු අධික වන්නේ කිරි, ශුක්‍ර හා කළු යන මේවා සමඟ මධුර රසය සමවායී ලෙස බැඳී ඇති බැවිනි.

තවද මෙහිදී කිවයුතු තවත් කරුණක් නම් සමවාය පිළිබඳ චරකයේ මතය වන සිය ගුණයන් සමඟ පෘථිවි ආදීන්ගේ වෙන් නොවී පවතින සම්බන්ධය සමවාය සම්බන්ධයක් නම් වන බවයි.

"සමවායො පෘථග්භාවො
භූම්‍යාදීනාං ගුණෛර්මතඃ
ස නිත්‍යො යත්‍ර හි ද්‍රව්‍යං
න තත්‍රානියතො ගුණඃ"

උදා: මධුර රසයෙන් යුතු ආහාර පාන අධිකව ගැනීමෙන් කළු දෝෂය අධික වන්නේ කළු දෝෂය හා මධුර රසය සමඟ පෘථිවි සහ ආප් භූත සමවායී ලෙස බැඳී ඇති බැවිනි.

තවද ප්‍රත්‍යක්ෂ ප්‍රමාණය පිළිබඳව දැක්වීමේදී ඉන්ද්‍රිය හා අර්ථ අතර සන්නිකර්ෂය ප්‍රභේද කිරීමේ දී ද මෙම සමවාය පදාර්ථය උපයෝගී වේ.

උදා: ආකාශ භූතය මගින් ශබ්දය නම් අර්ථය කර්ණය මගින් ලබාගෙන ශ්‍රෝත්‍ර ඉන්ද්‍රියේදී අවබෝධ කර ගනී.

මෙහිදී සහභාගී වන පංච මහා භූතය, අර්ථය, ඉන්ද්‍රිය අධිෂ්ඨානය හා ඥානේන්ද්‍රිය අතර පවතින්නේ සමවායී සම්බන්ධයකි.

මේ අයුරින් අනෙකුත් ඉන්ද්‍රියයන් හතරට ද සමවාය පදාර්ථය උපයෝගී වන අන්දම පැහැදිලි කළ හැකි අතර යම් විටෙක ඉහත පරිදි වූ සමවායී සම්බන්ධයන් රෝගී පරීක්‍ෂාව මඟින් රෝග ලක්‍ෂණ හඳුනා ගැනීමේදී උපකාරී වේ.

උදා: වාත කෝප වූ විට පීඩිත වූ ස්ථානය කළු හෝ අරුණ වර්ණ ගැනීම මඟින් හඳුනාගත හැක.

මීළඟට අපි ආයුර්වේදයේ දී අභාව පදාර්ථයේ යෙදීම් පිළිබඳව සලකා බලමු. ආයුර්වේදයේ දී අභාව පදාර්ථය එතරම් පිළිගැනීමකට ලක් නොවුනත් ආයුර්වේද චිකිත්සාවේදී රෝග නිර්ණය හා රෝග පැවැත්ම පිළිබඳවත් ජීවීන්ගේ පැවැත්ම පිළිබඳවත් කථාකිරීමේ දී අභාව පදාර්ථය උපයෝගී වේ.

ප්‍රාක් අභාව යනුවෙන් දැක්වූ කාර්යය උත්පත්තියට පෙර යම් දෙයක අභාවය සමහර රෝග සම්බන්ධයෙන් ද දැක්විය හැක.

උදාහරණ ලෙස යම් තැනැත්තෙකුට උණ රෝගයක් වැළඳීමට පෙර ඔහුට උණ තිබී නැත.

තවද මිනිසාගේ දත් ඇතිවීම ද ප්‍රාක් අභාව මඟින් පැහැදිලි කළ හැක. එනම් කුඩා ළදරුවකුගේ මුවේ දත් නොමැති අතර ළදරුවා වර්ධනයත් සමඟ දත් ද ඇතිවේ.

කිසියම් භාවයක් මඟින් ඇතිවී ද්‍රව්‍යයේ විනාශය සිදුවේ ද එය ප්‍රධ්වංසාභාව නමින් හැඳින්වූ බැවින් මිනිසකුගේ මියයාම, යම්කිසි ද්‍රව්‍යයක විනාශය හා සමහර රෝගයන්ගේ සුවවීම් මේ යටතේ දැක්විය හැක.

එසේම මිනිසකු මියගිය විට ද ඔහු නැවතත් එම ආත්මභාවයේ උපදින්නේ නැත. මේ අනුව මෙම අභාව ප්‍රභේදයට ආදියක් ඇතත් අන්තයක් නැති බව කිව හැක.

මී ළඟට අත්‍යන්තාභාව යනුවෙන් දැක්වූයේ ත්‍රිකාලයෙහිම යම් කිසි දෙයක පැවැත්මක් නොතිබීමයි.

එනම් මෙහිදී යම් දෙයක් අතීතයේ දී, වර්තමානයේදී හෝ අනාගතයේ දී නොපැවතිය යුතුය. කණාද දර්ශනයට අනුව "මිනිසාට අං ඇතිවීම" යන්න මෙයින් පැහැදිලි කළ හැක. එනම් ත්‍රි කාලයෙහිදීම "මිනිසාට අං ඇතිවීම" යන්න සිදු නොවන්නකි.

යමක් ආත්ම සම්බන්ධයෙන් තොර වූ අභාවයක් වේ ද එය අන්‍යොන්‍යාභාව නමින් දක්වා ඇත.

රෝග නිර්ණයේදී මෙම අභාව පදාර්ථය යොදාගැනීමට උදාහරණයක් ලෙස උණ යනු පාචනය නොවන බව පැහැදිලි කර ගැනීම දැක්විය හැක.

එලෙසම ඖෂධ හා ආහාර ද්‍රව්‍ය තෝරා ගැනීමේදී ද මෙය වැදගත් වේ. එනම් කිසි දිනක අරළු යනු කොත්තමල්ලි නොවන බවයි.

මේ අනුව ඉහතින් දැක්වූ කරුණු පැහැදිලි කිරීම් අනුව වෛශේෂික දර්ශනයේ දී කියවෙන සප්ත පදාර්ථ ආයුර්වේදයේ උපයෝගී කර ගන්නා අන්දම පිළිබඳව අවබෝධයක් ලැබෙන්නට ඇත. කෙසේ වෙතත් විශාල වශයෙන් සමානකම් සහිතවත් සුළු වෙනස්කම් සහිතවත් මෙම දර්ශනයන් දෙකෙහිදී කියැවෙන සප්ත පදාර්ථයන් සංසන්දනය කළ හැකි අතර එම සප්ත පදාර්ථයන් ප්‍රධාන වශයෙන් ආයුර්වේද චිකිත්සාවේ දී උපයෝගී කරගන්නා බව අවධාරණය කල හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය - ඇම් හිරියන්න
2. ආයුර්වේද සමීක්ෂාව, පළමු වෙළුම, දසවන කළඹ - ආයුර්වේද දෙපාර්තමේන්තුව
3. දෝෂ, ධාතු මල විඥානය - ඩී. එම්. ආර්. බී. දිසානායක
4. ද්‍රව්‍ය මූලධර්ම - එච්. අයි. චන්ද්‍රසේකර
5. සුශ්‍රැත සංහිතාව


කාලාර්ථකර්මණාං යෝගෝහීනමිථ්‍යාතිමාත්‍රකඃ
සම්‍යග්යෝගශ්ච විඥෙයෝ - රෝගාරෝග්‍යෛකකාරණම්
(අෂ්ටාංගහෘදය/සූ/1)

කාලය, ඉන්ද්‍රිය අර්ථ ග්‍රහණය, ක්‍රියාව යන තුනෙහි හීනබව, වැරදි බව හා අධික බව රෝග ඇතිවීමට හේතු වේ. ඒවායේ සම පැවැත්ම නිරෝගී බවට හේතු වේ.